**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-------------------------

(අ) ඉතිරි තොග අගය කිරීම, මිල කිරීම හා ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) උපචිත පදනම මත ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.833,000 ක ස්ථාවර තැන්පතු ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් සඳහා ගෙවිය යුතු රු.798,968 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සේවකයින් 12 දෙනෙකුගේ ඇප තැන්පත් රු.21,300 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) මිලදී ගත් යන්ත්‍ර උපකරන හා ලී බඩුවල වටිනාකම රු.129,320 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) ණයහිමියන් සඳහා ප්‍රතිපාදනය රු.1,793,858 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) රු.385,534 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පොදු තැන්පත් රු.1,228,859 ක් වන නමුත්, පොදු තැන්පත් ලේඛනය අනුව වටිනාකම රු.973,215 ක් විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වටිනාකම වූ රු.14,695,222 ක් හා ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.7,275,280 ක් අයකර ගැනීමට / ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.103,885,122 ක් වූ ගිණුම් විෂයන් 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 132 (ඒ) (ඩී) වගන්ති | අනුමැතිය ලබා නොගෙන රු.167,725 ක් සභා සභා අරමුදලින් වැයකර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) රීති 5(7) | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි |
| (ii) රීති 217 හා 218 | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් කර නොතිබුණි |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | අවස්ථා 05 කදී ග්‍රාම සංවර්ධන සමිති 02 ක් වෙත රු. 494,051 ක අත්තිකාරම් ලබාදී තිබුණද, කර්මාන්තය නිමකර නොතිබුණු අතර, අත්තිකාරම් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) **ගැසට් පත්‍ර** | |
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්තාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2361 හා 2015 දෙසැම්බර් 04 දිනැති ගැසට් පත්‍රය | සම්ප්‍රේෂණ කුළුණු 05 ක් සඳහා 2016 වාර්ෂික ගාස්තුව රු.15,000 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ii) 2015 දෙසැම්බර් 08 දිනැති දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අංක 1946 | ප්‍රචාරක දැන්වීම් පුවරු 14 ක් සඳහා ගාස්තු අයකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | චක්‍රලේඛ<br>----------<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ 09/2009(1) 2009 අප්‍රේල් 16 දිනැති චක්‍රලේඛය හා ඌව පලාත් ප්‍රධාන ලේකම්ගේ අංක 03/2016 හා 2016 සැප්තැම්බර් 23 දිනැති චක්‍රලේඛ | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මඟින් සභාවේ අංක 09/2009 හා සේවකයන්ගේ දෛනික පැමිණීම හා පිටවීම සනාථ දරන කරගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,537,026 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,338,210 ක් විය.

2.3 **ආදායම් පරිපාලනය**
----------------------

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**
----------------------------------------

සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.994,229 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ආදායමෙන් රු.798,432 ක් එනම් සියයට 28 ක් හිඟ හිටිව තිබුණි.

2.3.2 **කඩ කුලී**
----------

කඩ කාමර 22 ක් සඳහා 2014 හා 2015 වර්ෂවල ලැබූ නව තක්සේරු අනුව ගිවිසුම්ගතව තිබියදී 2010 තක්සේරුව පදනම් කරගෙන කඩ කුලී අයකිරීම් කිරීම හේතුවෙන් රු.198,075 ක් අඩුවෙන් අයකර තිබුණි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.2,350,000 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
------------------------------------

ත්‍රී රෝද රථ ගාල් 04 හි ලි ත්‍රිරෝද රථ 104 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
-------------------------------

ප්‍රාග්ධන වැඩ සටහන යටතේ රු.5,060,176 ක වියදමින් සැලසුම් කර ගත් කර්මාන්ත 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

සභාව සතු වාහන 02 ක් සහ ඩොලමයිට් ව්‍යාපෘතියෙහි ගොඩනැගිල්ල පිළිවෙලින් වසර 05 සිට වසර 18 ක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

3.4 **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකර රැස්කරනු ලබන කසළ 10 කණුව ප්‍රදේශයේ විවෘත කඳු සහිත භූමියකට බැහැර කරමින් තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) වාහන පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(ඉ) ගබඩා පාලනය
(ඊ) අත්තිකාරම් ලබාදීම